# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2216/34 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

### (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත

(451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64 (2) ඊ වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැළෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

විමලවීර දිසානායක,<br>
වනජීවී රැකවරණය, අලිවැට හා අගල්<br>
ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල්<br>
හා කැළෑ නැවත වගා කිරීම හා වන සම්පත්<br>
සංවර්ධන රාජ්‍ය අමාත්‍ය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,<br>
කොළඹ දී ය.

නියෝගය

1. මෙම නියෝග 2021 අංක 01 දරන වන සංරක්ෂණ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අංක 1600/18 හා 2009.05.06 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනයේ සඳහන් අයිතම අංක 10 (1) ඉවත්කර මෙයින් සංශෝධනය කරනු ලැබේ :




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


| මගේ අංකය / எனது இல / My No. | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| L2/1/79/ කළුගල් කැණීම් | | 2021.03.30 |

චක්‍රලේඛ අංකය **2021/02**

**සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,**

**රජයේ ඉඩම් තුල කළුගල් කැණීමේදී අයකරනු ලබන ගාස්තු නිර්ණය කිරිම**

මෙරට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති හා ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය වන වැලි, බොරළු, කළුගල් කැණීමේදී අයකරනු ලබන ගාස්තු නිර්ණය කිරිම හා කැණීම් බලපත්‍ර කඩිනමින් ලබාදීම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ලබාදීම සඳහා ජනාධිපති කාර්යසාධක බලකායක් පත්කර ඇත.

02. එම බලකාය මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ අනුව ඛණිජ ද්‍රව්‍ය කැණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලබාදීම සඳහා සවිස්තරාත්මක චක්‍රලේඛයක් ඉදිරියේදී නිකුත් කිරීමට නියමිතව ඇත.

03. එමෙන්ම කළුගල් කැණීමේදී අය කරනු ලබන ගාස්තු නිර්ණය කරමින් වන සංරක්ෂක ජනරාල් විසින් 2216/34 හා 2021.02.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව එම ගැසට් නිවේදනයේ සඳහන් පරිදි කළුගල් හෝ සක්ක ගල් සඳහා පහත පරිදි ගාස්තු අය කිරීමට ක්‍රියා කල යුතු වේ.

| | | |
|---|---|---|
| කියුබ් 50 දක්වා | - | කියුබ් 1ක් රු.125.00 |
| කියුබ් 51 සිට 250 දක්වා | - | කියුබ් 1ක් රු. 250.00 |
| කියුබ් 251-1000 දක්වා | - | කියුබ් 1ක් රු. 375.00 |
| කියුබ් 1000 වැඩි | - | කියුබ් 1ක් රු 500.00 |

04. ඒ අනුව රජයේ ඉඩම්වල පිහිටි කළුගල්, කැණීම සඳහා භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් බලපත්‍ර නිකුත් කල පසු එම බලපත්‍ර පදනම් කර ගනිමින් ඉහත ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන ලෙසත්, කැණීම් කටයුතු සඳහා රජයේ ඉඩමක් පරිහරණය කරන අවස්ථාවලදී දැනටමත් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය පදනම් කරගනිමින් එම ඉඩම් කොටස සඳහා වාර්ෂික අවසර පත්‍රයක් ලබාදීමට ක්‍රියාකරන ලෙසත් කාරුණිකව දන්වමි. (අංක 2216/34 හා 2021.02.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

**ජී.ඩී. කිරිති ගමගේ**
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

01. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
02. ලේකම්, ජනාධිපති කාර්යසාධන බලකාය - කරු. දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ ජනරාල්, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය - කරු. දැ.ගැ. හා අ.ක.ස.
04. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු, - කරු. දැ.ගැ. හා අ.ක.ස.
05. සියළුම ඉඩම් කොමසාරිස් / සහකාර ඉඩම් කොමසාරිස්වරු, (අන්තර් පළාත්) - කරු. දැ.ගැ. හා අ.ක.ස.


| ආයතන / நிர்வாகம் / Admin | ගිණුම් / கணக்கு / Accounts | ඉඩම් I / காணி I / Land I | ඉඩම් II / காணி II / Land II | ඉඩම් III / காணி III / Land III |
|---|---|---|---|---|
| ☎ 011 279 7479 | ☎ 011 287 5833 | ☎ 011 287 4025 | ☎ 011 287 5834 | ☎ 011 279 748 |
| 🖷 011 287 3033 | 🖷 011 286 4462 | 🖷 011 288 3812 | 🖷 011 287 3110 | 🖷 011 288 363 |

ඊමේල් ஈ-மெயில் E-mail - landcom@landcommdept.gov.lk    වෙබ් ලිපිනය இணையம் Web Address - www.lancommdept.gov.lk

උපලේඛනය

| අයිතමය | ප්‍රමාණය | ගාස්තු<br>රු. ශ. |
|---|---|---|
| 10. වන නිෂ්පාදනඃ | | |
| (01) කළුගල් හෝ සක්ක ගල් : | | |
| කියුබ් 50 දක්වා | කියුබ් 01ක් | 125 00 |
| කියුබ් 51 - 250 දක්වා | කියුබ් 01ක් | 250 00 |
| කියුබ් 251 - 1,000 දක්වා | කියුබ් 01ක් | 375 00 |
| කියුබ් 1,001ට වැඩි | කියුබ් 01ක් | 500 00 |

03 - 285/1

---

## (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත

(451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 8 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව වන සංරක්ෂක ජනරාල් විසින් පනවනු ලබන ගාස්තු සංශෝධනය.

වන සංරක්ෂක ජනරාල්.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

අංක 1600/18 හා 2009.05.06 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනයේ සඳහන් අයිතම අංක 10 (1) ඉවත්කර මෙයින් සංශෝධනය කරනු ලැබේ :

උපලේඛනය

| අයිතමය | ප්‍රමාණය | ගාස්තු<br>රු. ශ. |
|---|---|---|
| 10. වන නිෂ්පාදන : | | |
| (01) කළු ගල් හෝ සක්ක ගල් : | | |
| කියුබ් 50 දක්වා | කියුබ් 01ක් | 125 00 |
| කියුබ් 51 - 250 දක්වා | කියුබ් 01ක් | 250 00 |
| කියුබ් 251 - 1,000 දක්වා | කියුබ් 01ක් | 375 00 |
| කියුබ් 1,001ට වැඩි | කියුබ් 01ක් | 500 00 |

03 - 285/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.